ස.සේ.කො.චක්‍රලේඛ අංක 06/2020

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2020.12.28

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු,

## සමුපකාර සේවකයින්ට සංයුක්ත දීමනා ගෙවීම

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව මඟින් උක්ත කැරුණට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක වයඹ/ස.සෙ.කො./04/2016 චක්‍රලේඛය සංශෝධනය කරමින් සමුපකාර සේවකයින්ට සංයුක්ත දීමනා ගෙවීම සම්බන්ධයෙන් වන විධි විධාන ඇතුලත් මෙම චක්‍රලේඛය 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කිරීමට 2020.11.16 දින රැස් වූ කොමිෂන් සභාව තීරණය කර ඇත.

2. රාජකාරි සඳහා සේවා ස්ථානයෙන් බැහැරව ගමන් බිමන් යාමට නියම වී ඇති මාසික වැටුප් ලබන සේවකයින්ට ඔහු සිය සේවා ස්ථානයේ රාජකාරි සඳහා පිටවී සිටින කාලය වෙනුවෙන් ඔහුගේ යැපීම් හා නවාතැන් සම්බන්ධයෙන් වන සංයුක්ත වියදම් පියවා ගැනීමට පහත විධිවිධාන වලට අනුකූලව සංයුක්ත දීමනා ගෙවනු ලැබේ.

2.1. ගෙවිය හැකි අවස්ථා : ගමනේ දුර ප්‍රමාණය, යාම් හා ඊම් ඇතුලත්ව කිලෝමීටර 12 කට වැඩි ගමන් සඳහා පමණි.

2.2. ගාස්තු ප්‍රමාණ: පහත පරිදි මාසික වැටුප් ලබන සේවකයන්ගේ සේවා මට්ටම් සැලකිල්ලට ගෙන ගෙවිය යුතු සංයුක්ත දීමනාවේ ප්‍රමාණය නිගමනය කළ යුතුය. සමිති වල සේවා අවශ්‍යතාවය හා කාර්ය භාරය සළකා බලා මසකට දින 10 කට උපරිමයකට යටත්ව මෙම දීමනාව ගෙවිය හැකිය.

| සේවා මට්ටම | පැය 24 ක එක් එක් කාලපරිච්ඡේදය සඳහා වන සංයුක්ත දීමනාව |
|---|---|
| මධ්‍ය විධායක හා ප්‍රධාන විධායක | රු. 800.00 |
| අධීක්ෂණ හා අධීක්ෂණ ඉහළ | රු. 700.00 |
| මෙහෙයුම් | රු. 600.00 |
| කළමනාකරණ සහය සේවා | රු. 500.00 |

2.3. රාජකාරියේ නියුතු පැය 12 කට නොඅඩු පැය 24 ක කාලපරිච්ඡේදයක් දක්වා සම්පූර්ණ සංයුක්ත දීමනාවද , පැය 06 කට නොඅඩු කාලපරිච්ඡේදයක් සඳහා සංයුක්ත දීමනාවෙන් අඩක්ද, ගෙවිය යුතු අතර පැය 06 කට අඩු කාල සීමාවක් සඳහා සංයුක්ත දීමනාව හිමි නොවේ.

2.4. නිලධාරියෙකු පැය 24 කට අධික කාලයක් සිය සේවා ස්ථානයෙන් බැහැරව රාජකාරි සඳහා ගත කර ඇත්නම් දින 07ක උපරිමයකට යටත්ව එම පැය 24 ක අඛණ්ඩ කාලයක් සඳහා සංයුක්ත දීමනාවෙන් ¼ අතිරේක දීමනාවකට හිමිකම් ලබයි. පැය 24 කට අඩු කාලයක් සඳහා මෙම දීමනාව හිමි නොවේ.

3. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

පිටපත්- :
1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.